විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

# විදේශ අමාත්‍යාංශය ආර්ථික රාජ්‍යතාන්ත්‍රික හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සඳහා සහයෝගීතා ප්‍රවර්ධන සුහද හමුවක් පවත්වයි

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, එහි ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන යටතේ, 2026 ජුනි 08 වැනි දින, ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේදී, විදේශ රාජ්‍යතාන්ත්‍රිකයින්, ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන්, වාණිජ මණ්ඩල නියෝජිතයින් සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින් සඳහා සහයෝගීතා ප්‍රවර්ධන සුහද හමුවක් පැවැත්වීය.

මෙම උත්සවයේදී අදහස් දක්වමින්, විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර, වඩාත් ඵලදායී ආර්ථික රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, රජයේ ආයතන සහ ව්‍යාපාරික ප්‍රජාව අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. ආර්ථික සහයෝගීතාවය සඳහා පහසුකම් සපයන්නෙකු, ප්‍රවර්ධනය කරන්නෙකු සහ සක්‍රිය කරන්නෙකු ලෙස විදේශ අමාත්‍යාංශයේ කාර්යභාරය අවධාරණය කරමින්, ඵලදායී හවුල්කාරිත්වයන් වර්ධනය කිරීමට සහ ගුණාත්මක ආයෝජන සහ වෙළෙඳ අවස්ථා සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය සහාය සහ සහයෝගය ලබා දීමට අමාත්‍යාංශයේ කැපවීම ඔහු නැවත තහවුරු කළේය. හොඳින් සැලසුම් කරන ලද ආර්ථික රාජ්‍යතාන්ත්‍රික මුලපිරීම්, විදේශ ප්‍රතිපත්තිය සහ දේශීය සංවර්ධන ප්‍රමුඛතා අතර පාලමක් ලෙස ක්‍රියා කරන බවත්, ජාත්‍යන්තර මැදිහත්වීම තුළින් රටට පැහැදිලිව අත්විඳිය හැකි ආර්ථික ප්‍රතිලාභ ලබා දීමේ හැකියාව පවතින බවත් නියෝජ්‍ය අමාත්‍යවරයා අවධාරණය කළේය.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ සිය අදහස් දැක්වීමේදී, විවිධ ක්ෂේත්‍ර හරහා ශ්‍රී ලංකාව සතු ශක්තිමත් හැකියාවන් අවධාරණය කළ අතර, වෙළෙඳාම, ආයෝජන සහ ආර්ථික හවුල්කාරිත්වය සඳහා ආකර්ශනීය ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ අද්විතීය වටිනාකම අවධාරනය කළේය.

වැඩසටහනේ නිල කටයුතු වලින් අනතුරුව, අදහස් හුවමාරු කර ගැනීමට, හවුල්කාරිත්වයන් ගවේෂණය කිරීමට සහ සහභාගිවන්නන් අතර වෘත්තීය සහ ආයතනික සබඳතා ශක්තිමත් කිරීමට අවස්ථාව සළසමින්, අන්තර්ක්‍රියාකාරී සුහද හමුවක් පැවැත්විණි.

ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වයේ වර්ධනය වන වැදගත්කම සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය වීම අරමුණු කරගත් සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ හවුල් කැපවීම පිළිබිඹු කරමින්, රජය, ව්‍යාපාරික සහ රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාවන් නියෝජනය කරමින් නියෝජිතයින් 100ක් පමණ මෙම අවස්ථාවට සහභාගී විය.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ

2026 ජුනි 11 වැනි දින

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk